දැරණියගල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 18 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ට අයත් වාහන තුනක වටිනාකම වූ රු.5,785,875 ක් ස්ථාවර වත්කම් යටතේ දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වර්ෂ කිහිපයක සිට ශේෂ පත්‍රයේ අයකරගත හැකි උපයෝගී සේවා යටතේ මුදල් මාරු ලෙස දක්වා ඇති රු.512,000 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ලැබී තිබූ රු.190,000 ක් ප්‍රාග්ධන ලැබීම්, පොදු තැන්පත් ගිණුම මගින් වැය කිරීම් හේතුවෙන් එය ප්‍රාග්ධන ආදායම් හා වියදම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ පී.වී.සී බට තොග වටිනාකම වූ රු.728,750ක් සමාලෝචිත වර්ෂය තුළදී ගිණුම් වලට ගැනීමේදී පරිත්‍යාග ගිණුමට බැර කිරීම වෙනුවට, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැරකර තිබුණි.

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 03 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 10,352,541 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 3,916,461 ක් වූයෙන් නොසැසඳුනු වෙනස රු. 6,436,080 ක් විය.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01ක කාලයක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් (පෙර ගෙවුම්) ශේෂ වල වටිනාකම රු. 955,216 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 1,611,743 ක් විය.

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,623,558 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,712,146 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,088,588 ක පිරිහීමක් දක්නට ලැබුණි.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන විග්‍රහාත්මක සමාලෝචනය</u>

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් වරිපනම් බදු ආදායම අඩුවීම හා වැටුප් දීමනා ,සැපයුම් හා උපකරණ ,ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම් වැඩිවීම බලපා තිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

<u>ආදායම් ප්‍රභවය</u>

| | <u>ඇස්තමේන්තුගත</u> | <u>තථ්‍ය</u> | <u>දෙසැම්බර්31දිනට සමුච්චිත හිඟය</u> |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 5,895 | 5,380 | 515 |
| (ii) බදු කුලී | 5,093 | 4,094 | 999 |
| (iii) බලපත්‍ර ගාස්තු | 552 | 647 | 94 |
| (iv) වෙනත් ආදායම් | 17,257 | 14,059 | 3,198 |

2.3.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

විවිධ ආඥාපනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 කින් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 <u>අක්කර බදු</u>

දීර්ඝ කාලයක සිට පැවත එන අක්කර බදු රු.175,922 ක්1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ158 (1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

සේවක ණය ලේඛනය අනුව, 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 2,198,322 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු. 219,212 ක් විය.

3.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ 2011 වර්ෂයේ මාර්ග සංවර්ධන වැඩ සටහනට අදාල ගෙවීම් එම වර්ෂය තුළදී ගෙවා අවසන් කළයුතු වුවද, අඩුපාඩු සහිතව ගෙවීම් බිල්පත් ඉදිරිපත් කිරීමෙන් හා කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය හේතුවෙන් කර්මාන්තය වෙනුවෙන් ගෙවන ලද රු. 500,000 ක මුදල 2013 වර්ෂය අවසන් වන විටත් සභාව ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

04. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් නොතිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) තොග පාලනය

(ii) ආදායම් පරිපාලනය

(iii) වත්කම් කළමනාකරණය